| තැන්පතු මත වූ අයිරා සඳහා ඉල්ලුම්පත්‍රය | CBL 001 |
| --- | --- |
| (තනි පුද්ගල හා බද්ධ ගිණුම් හිමියන් සඳහා)-වී.5 | |

| | | | |
| --- | --- | --- | --- |
| කළමනාකරු,<br>නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී | | | NDB bank<br>Our Commitment. Your Success. |
| | ගනුදෙනුකරුගේ කාණ්ඩය | සාමාන්‍ය පාරිභෝගික කාණ්ඩය | |
| දිනය: 12/13/2024 10:01 | ගනුදෙනුකරු හඳුනාගැනීමේ අංකය | | මීළඟ සමාලෝචන දිනය |

**1 සේවා ලාභියාගේ තොරතුරු සහ සම්බන්ධ කරගත හැකි විස්තර**

| ඉල්ලුම්කරුගේ/ ඉල්ලුම්කරුවන්ගේ සම්පූර්ණ නම/ නම් | ඉල්ලුම්කරුගේ/ ඉල්ලුම්කරුවන්ගේ ලිපිනය/විද්‍යුත් තැපැල් ලිපිනය | ජා.හැ. අංකය | දුරකතන අංක ජංගම | කාර්යාලීය | නිවස |
| --- | --- | --- | --- | --- | --- |
| 1 | | | | | |
| | | | | | |
| 2 | | | | | |
| | | | | | |
| 3 | | | | | |
| | | | | | |
| 4 | | | | | |
| | | | | | |

**2 ගිණුම් විස්තර**

| | |
| --- | --- |
| ඉතිරි කිරීමේ ගිණුම් අංකය | |
| ජංගම ගිණුම් අංකය | |

**3 පහසුකම පිළිබඳ විස්තර**

| | |
| --- | --- |
| පහසුකම් වර්ගය | අයිරා |
| කාර්යය | |
| සමුච්චිත අයිරා සීමාව | |
| wdhi qf . ùf ï l d i Sd | ඉල්ලූ විට |
| ඉල්ලීමේ ස්වභාවය | |

**4 ඇපකරයේ වර්ගය (තෝරන්න)** ස්වකීය තැන්පතුව - බද්ධ

තැන්පතු හතකට (07) වැඩි ප්‍රමාණයක් තිබේ නම් වගුවේ (අ) සිට (උ) දක්වා වන තීරයන් පුරවන්න

| තැන්පතු හිමියාගේ සම්පූර්ණ නම | තැන්පතුවේ ස්වභාවය | මුදල් වර්ගය | පොළී අනුපාතික | තැන්පතු ගිණුම් අංකය | කල් ඉකුත් වන දිනය | තැන්පතු මුදල |
| --- | --- | --- | --- | --- | --- | --- |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |

| ජංගම දුරකතන අංකය | | SMS හරහා බැංකුවෙන් යම් නිවේදන ගෙන්වා ගැනීමට ඔබගේ විරෝධතාවක් නොමැති නම් (x) ලෙස ලකුණු කරන්න |
| --- | --- | --- |

මා/අප විසින් ඉහත ඇතුළත් කර ඇති විස්තර සත්‍ය බව සහ නිවැරදි වන බවට මෙයින් සහතික කර සිටින අතර පසුපිටෙහි සඳහන් නියම සහ කොන්දේසිවලට අනුකූලව කටයුතු කිරීමට එකඟ වන්නෙමි/ වන්නෙමු.

| 1. ඉල්ලුම්කරුගේ අත්සන | 2. ඉල්ලුම්කරුගේ අත්සන | 3. ඉල්ලුම්කරුගේ අත්සන | 4. ඉල්ලුම්කරුගේ අත්සන |
| --- | --- | --- | --- |

| | | | | |
| --- | --- | --- | --- | --- |
| අත්සන/අත්සන් සත්‍ය බව තහවුරු කරගන්නා ලදී ☐ | බැංකු නිලධරයාගේ නම | | බැංකු නිලධරයාගේ අත්සන | |
| | EPF | | | |

| ඇපකර පිළිබඳ විස්තර ඇතුළත් කරන්න | ක්ලික් කරන්න | | |
|---|---|---|---|
| ඔබට ඇපකර 7 කට වැඩි ප්‍රමාණයක් ඇතුළත් කිරීමට අවශ්‍ය වන්නේ නම්, "ඇපකර පිළිබඳ විස්තර" තීරුව වෙත ගොස් විස්තර ඇතුළත් කරන්න. | | | |
| **සතිපතා AWPLR ඇතුළත් කරන්න** | | | |
| AWPLR | 0.00% | | |

## නියම හා කොන්දේසි

## තැන්පතු මත වූ අයිරා

මෙහි පසුපිටේ දක්වා ඇති පරිදි බැංකුවේ පවත්වාගෙන යනු ලබන මාගේ/අපගේ මුළු තැන්පතු ගිණුමේ (ගිණුම්වල) ශේෂයන්ට එරෙහිව මාගේ/අපගේ ජංගම ගිණුම (ගිණුම්) මත අයිරා පහසුකම ලබා දීම/ වැඩි කිරීම/ අඩු කිරීම සඳහා ලියාපදිංචි අංක. PQ 27 දරන නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී ආයතනය විසින්, කැමැත්ත පළ කිරීම සැලකිල්ලට ගෙන, පහත දැක්වෙන නියම සහ කොන්දේසිවලට යටත්ව පහත ඇමුණුමේ විස්තර කර ඇති පහසුකම ලබා ගැනීමට මා/අප විසින් මෙයින් භාරගෙන එකඟව සිටිනු ලැබේ.

පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස, මෙම නියම සහ කොන්දේසිවල;

(අ) "ගිණුම" යන්නෙන්, ඉල්ලුම්පත්‍රයේ 2 වන අයිතමයේ නිශ්චිතව ඒකාබද්ධව දක්වා ඇති ගිණුම් අංකය දරන්නා වූ ද, (තනි තනිව හෝ වෙනත් තැනැත්තකු සමග ඒකාබද්ධව හෝ හිමිකාරිත්වයක, හවුල් ව්‍යාපාරයක හෝ සමාගමක නමින් වුව ද) ණය ගැනුම්කරුගේ නමින් බැංකුවේ පවත්වාගෙන යන්නා වූ හෝ පවත්වාගෙන යනු ලැබීමට නියමිත වූ ද බැංකු ගිණුම හෝ ගිණුම් අදහස් වේ.

(ආ) "ඉල්ලුම් පත්‍රය" යන්නෙන්, පසුපිටේ දැක්වෙන අයිරා සඳහා තැන්පතු මත වූ අයිරා ඉල්ලුම් පත්‍රය අදහස් වේ.

(ඇ) "AWPLR" යන්නෙන්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සතිපතා සකස් කරනු ලබන බර තබන ලද සාමාන්‍ය ප්‍රමුඛ ණය අනුපාතිකය අදහස් වන්නේ ය.

(ඈ) "බැංකුව" හෝ "එන්.ඩී.බී. බැංකුව" යන්නෙන්, ලියාපදිංචි අංක. PQ 27 දරන්නා වූ ද අංක 40, නවම් මාවත, කොළඹ 02 යන ස්ථානයේ ස්වකීය ලියාපදිංචි කාර්යාලය පිහිටා

ඇත්තා වූ ද නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී ආයතනය අදහස් වන අතර අවස්ථාවෝචිත පරිදි එහි අනුප්‍රාප්තිකයන් සහ පැවරුම්ලාභීන් ඊට ඇතුළත් වන්නේ ය;

(ඉ) "ණය ගැනුම්කරු" යන්නෙන්, බැංකුවෙන් අයිරා පහසුකමක් ලබා ගැනීම සඳහා වන ඉල්ලුම්පත්‍රයේ 1 වන අයිතමයේ සවිස්තරාත්මකව විස්තර කර ඇති ඉල්ලුම්කරු/ ඉල්ලුම්කරුවන් ද සමග අවස්ථාවෝචිත පරිදි ඔහුගේ/ ඇයගේ/ එහි/ ඔවුන්ගේ අදාළ උරුමක්කරුවන්, පොල්මඃකරුවන්, අද්මිනිස්ත්‍රාසිකරුවන්, අනුප්‍රාප්තිකයන් සහ පැවරුම්ලාභීන් අදහස් වන්නේ ය.

(ඊ) "තැන්පතුව/තැන්පතු" යන්නෙන්, මෙම ඉල්ලුම්පත්‍රයේ 4 වන අයිතමයේ සවිස්තරාත්මකව විස්තර කර ඇති ඉතිරි කිරීමේ ගිණුම් ඇතුළු තැන්පතුව හෝ තැන්පතු අදහස් වන අතර මෙම නියම සහ කොන්දේසිවල 9 වන වගන්තියේ සඳහන් කර ඇති අලුත් කරන ලද තැන්පතු ඊට ඇතුළත් වන්නේ ය.

(උ) "තැන්පතු හිමියා" යන්නෙන්, ඉල්ලුම්පත්‍රයේ 4 වන අයිතමයේ නම් සහ තැන්පතු පිළිබඳ විස්තර ඇතුළත් වන්නා වූ තැන්පතු හිමියන් අදහස් වන්නේ ය.

(ඌ) "පහසුකම" යන්නෙන්, මෙම නියම සහ කොන්දේසිවල ඇමුණුමේ විස්තර කර ඇති ණය ගැනුම්කරු වෙත ප්‍රදානය කරන ලද අයිරා පහසුකම අදහස් වන්නේ ය.

(එ) "පහසුකම් පොළී අනුපාතිකය (අනුපාතික)" යන්නෙන්, බැංකුව විසින් පහසුකම මත අයකරනු ලබන පොළී අනුපාතිකය (අනුපාතික) අදහස් වේ. මේ සම්බන්ධයෙන් වන විට දී, එකී පොළී අනුපාතිකය අදාළ ලියම අයිතිය යටතේ බැංකුවේ තබා ඇති එක් එක් තැන්පතුවට/ තැන්පතුවලට අදාළ වන අනුරූපී පොළී අනුපාතිකය හා සම්බන්ධ වනු ඇත. විදේශ ව්‍යවහාර මුදල් තැන්පතුවක්/ තැන්පතු ඇපකරයක් මත ශ්‍රී.ල.රු. වලින් ලබා දී ඇති ණය පහසුකම් සඳහා වන පොළී අනුපාතිකය AWPLR සමඟ සම්බන්ධ විය යුතු ය. පහසුකම තැන්පතු ගණනාවකින් සුරක්ෂිත කර ඇති අවස්ථාවක දී, අයිරාගත ශේෂයන් මත වන පහසුකම් පොළී අනුපාතිකය (අනුපාතික) එක් එක් අනුරූපී අයිරා උප සීමාව වැඩි වන පිළිවෙලට අය කර ගනු ලැබේ.

(ඒ) "අයිරා උප සීමාව" යන්නෙන්, එක් එක් තැන්පතුව සම්බන්ධයෙන් බැංකුව විසින් නිශ්චය කරනු ලබන පහසුකම් සීමාව අදහස් වන්නේ ය.

(ඔ) "නියම සහ කොන්දේසි" යන්නෙන්, පහසුකම සඳහා අදාළ වන නියම සහ කොන්දේසි අදහස් වන අතර එය ඉල්ලුම්පත්‍රයේ කොටසක් වන්නේ ය.

මෙම නියම සහ කොන්දේසිවල ඒකවචන පදවලින් වන සඳහන් කිරීම්වලට බහුවචන පද ද ඇතුළත් වන අතර එහි ප්‍රතිලෝමය ද එසේ වන්නේ ය; එමෙන්ම පුරුෂලිංග අර්ථය ගෙන දෙන පදවලට ස්ත්‍රී ලිංග පද ද ඇතුළත් විය යුතු ය. ණය ගැනුම්කරුවන් එක් අයකුට වඩා වැඩි ගණනක් සිටින අවස්ථාවක දී, ණය ගැනුම්කරු යනුවෙන් වන සෑම සඳහනක්ම එක්ව සහ තනි තනිව ණය ගැනුම්කරුවන් සඳහා වන සඳහනක් ලෙස කියවනු ලැබිය යුතු ය.

1. මෙම පහසුකම ප්‍රදානය කිරීම බැංකුවේ පරම අභිමතය පරිදි සිදුවේ.

2. ණය ගැනුම්කරු විසින් ඉල්ලුම් පත්‍රයේ ඉල්ලා ඇති මුදල් ප්‍රමාණය කුමක් වුව ද, එය නොසලකා හරිමින් පහසුකම සඳහා විශේෂිත වූ නියමයන් මෙහි ඇමුණුමේ විස්තර කර ඇති පරිදි විය යුතු ය.

3. ඉල්ලුම් පත්‍රයේ ඇමුණුමේ සහ 'අ' උපලේඛනයේ පහසුකම ලබාගන්නා අවස්ථාවේ දී එකඟ විය යුතු වෙනත් අය කිරීම් සමඟ නියම කර ඇති පහසුකම් පොළී අනුපාතිකය (අනුපාතික) (තිබේ නම්) කුමක් වුව ද, පහසුකම මත වන පොළී අනුපාතික සහ අය කිරීම් ණය ගැනුම්කරු වෙත දැනුම් දීමකින් තොරව කලින් කලට වෙනස් කිරීමට සහ උච්චාවචනයන්ට යටත් වන බව ණය ගැනුම්කරු විසින් තවදුරටත් පිළිගනු ලැබේ. එම වෙනස් කිරීම් ණය ගැනුම්කරු විසින් නොපිළිගෙන/ ඔවුන්ට පිළිගත නොහැකිව ඒ සම්බන්ධයෙන් ලිඛිතව බැංකුව වෙත දැනුම් දෙනු ලබන අවස්ථාවක දී, ණය පහසුකම ඉල්ලූ විට ආපසු ගෙවිය යුතු වේ.

4. එකී අයිරා පහසුකම යටතේ අය විය යුතු සහ ගෙවිය යුතු සියලු මුදල් ණය ගැනුම්කරු විසින් බැංකුව වෙත ඉල්ලූ විට ගෙවිය යුතු ය.

5. ණය ගැනුම්කරු විසින් බැංකුව වෙත කරනු ලබන යම් ගෙවීම් බැංකුව විසින් පහත දැක්වෙන ප්‍රමුඛතා අනුපිළිවෙලට බැංකුව වෙත අය විය යුතු යම් ගෙවීම්වලට එරෙහිව අදාළ කරගනු ලැබේ:-

   (අ) වෙනත් අය කිරීම්

   (ආ) පොළිය

   (ඇ) පහසුකමේ මුල් මුදල

6. එක් එක් තැන්පතුවට සම්බන්ධ පහසුකම් පොළී අනුපාතිකය (අනුපාතික) සහ ආපසු ගෙවීමේ සීමාව, ශ්‍රී ලංකා රජය වසින් කලින් කලට අය කරනු ලබන ව්‍යවස්ථාපිත වෙනස්කම්වලට අනුකූලව වෙනස් කිරීමට බැංකුවට අයිතිය ඇත්තේ ය.

7. බැංකුවේ පවත්වාගෙන යනු ලබන (ඉල්ලුම්පත්‍රයේ 4 වන අයිතමයේ, මෙහි ඇමුණුමේ 8 වන අයිතමයේ සහ, තිබේ නම්, ඉල්ලුම්පත්‍රයේ 'අ' උපලේඛනයේ සවිස්තරාත්මකව විස්තර කර ඇති) තැන්පතුව/ තැන්පතු සහ ණය ගැනුම්කරු/ තැන්පතු හිමියා/ හිමියන් විසින් බැංකුවේ සිදු කරනු ලැබිය හැකි වෙනත් යම් තැන්පතුවක්/ තැන්පතු සම්බන්ධයෙන් වන ලියම අයිතිය ණය ගැනුම්කරු විසින් මෙයින් බැංකුව වෙත ලබා දෙනු ලබන අතර සහ/ හෝ තැන්පතු හිමියා/ හිමියන් විසින් එම කැප අයිතිය බැංකුව වෙත ලබා දීමට ණය ගැනුම්කරු විසින් කටයුතු සලස්වනු ලැබිය යුතු ය. මෙම තැන්පතුව/ තැන්පතු මෙම පහසුකමෙහි කාල සීමාව අතරතුර කල්පිරීමේ දී ස්වයංක්‍රීයවම අලුත් වනු ඇති අතර එය පහසුකම සඳහා ඇපකරයක් වශයෙන් දිගටම පවතිනු ඇත. තැන්පතුව/ තැන්පතු එහි කල් පිරීමේ දී නැවත ආයෝජනය කිරීමට ද එකී තැන්පතුව/ තැන්පතු බැංකුවේ අභිමතය පරිදි වැඩිදුර කාලසීමාවක් සඳහා අලුත් කිරීමට ද ණය පහසුකම සම්පූර්ණයෙන්ම ආපසු ගෙවන තෙක් වූ කාලයක් සඳහා එකී තැන්පතුව/ තැන්පතු ඇපකරයක් වශයෙන් රඳවා තබා ගැනීමට ද ණය ගැනුම්කරු විසින් බැංකුව වෙත බලය පවරනු ලබන අතර තැන්පතු හිමියා/ හිමියන් විසින් එසේ බැංකුව වෙත බලය පැවරීමට ගනුදෙනුකරුවන් විසින් කටයුතු සලස්වනු ලැබිය යුතු ය.

8. පහසුකම සම්පූර්ණයෙන්ම ආපසු ගෙවනු ලබන තෙක්, එසේ අලුත් කරන ලද තැන්පතුව/ තැන්පතු බැංකුව වෙත පවරා අත්කර දී තිබිය යුතු බවත් කිසිදු අවස්ථානුගත කරුණක් යටතේ (අවස්ථාවෝචිත පරිදි) ණය ගැනුම්කරු/ තැන්පතු හිමියා/ තැන්පතු හිමියන් විසින් හෝ ණය ගැනුම්කරුවන්ගේ හෝ තැන්පතු හිමියාගේ/ තැන්පතු හිමියන්ගේ උරුමක්කරුවන්, අද්මිනිස්ත්‍රාසිකරුවන්, පොල්මඃකරුවන් හෝ අනුප්‍රාප්තිකයන් සහ පැවරුම්ලාභීන් විසින් මුදල් ආපසු ගැනීමට හැකි නොවිය යුතු බවත් ණය ගැනුම්කරු විසින් කියා සිටිය යුතු මෙන්ම තැන්පතු හිමියා/ තැන්පතු හිමියන් විසින් එසේ කියා සිටිනු ලැබීමට කටයුතු සැලැස්විය යුතු ය.

9. (අ) තැන්පතුව/ තැන්පතු, අඛණ්ඩවම පහසුකම සඳහා වන ඇපයක් වශයෙන් රඳවා ගැනීමට,

(ආ) තැන්පතුව/ තැන්පතු ස්ථිර කාල සීමාවක් සඳහා වන බව සහ කාල සීමාව ඉකුත් වී තිබිය හැකි බව හෝ නොහැකි බව නොතකා තැන්පතුව/ තැන්පතු සම්පූර්ණයෙන්ම හෝ එහි යම් කොටසක් වශයෙන් ආපසු ගැනීම සඳහා වන ඉල්ලීමක් ප්‍රතික්ෂේප කිරීමට,

(ඇ) තැන්පතුව/ තැන්පතු ස්ථිර කාල සීමාවක් සඳහා වන බව සහ කාල සීමාව ඉකුත් වී තිබිය හැකි හෝ නොහැකි බව නොතකා තැන්පතුව/ තැන්පතු සම්පූර්ණයෙන්ම හෝ ඉන් යම් කොටසක් පහසුකම ආපසු ගෙවීම සඳහා අනුයෝජනය කිරීමට,

(ඈ) එවැනි යම් අනුයෝජනය කිරීමක කාර්යය සඳහා, ණය ගැනුම්කරුගේ/ තැන්පතු හිමියාගේ වියදමින්, තැන්පතුව/ තැන්පතු සම්පූර්ණයෙන්ම හෝ ඉන් යම් කොටසක් බැංකුව විසින් එය පවත්වාගෙන යනු ලබන ව්‍යවහාර මුදල් වර්ගය නොවන යම් ව්‍යවහාර මුදල් වර්ගයකට පරිවර්තනය කිරීමට,

(ඉ) මෙම පහසුකමෙහි කාලසීමාව ඇතුළත තැන්පතුව/ තැන්පතු කල් පිරීමේ දී එය ස්වයංක්‍රීයව අලුත් කිරීමට,

ණය ගැනුම්කරු විසින් බැංකුව වෙත අවලංගු කළ නොහැකි ලෙස බලය පවරා සිටින අතර තැන්පතු හිමියා/ තැන්පතු හිමියන් විසින් බැංකුව වෙත අවලංගු කළ නොහැකි ලෙස බලය පවරනු ලැබීමට කටයුතු සැලැස්විය යුතු ය.

10. ඉල්ලුම්පත්‍රයේ ඇමුණුමේ 4 වන අයිතමයේ (ඉ) තීරයේ සහ (තිබේ නම්) 'අ' උපලේඛනයේ (තිබේ නම්) විස්තර කර ඇති එක් එක් තැන්පතුව හා සම්බන්ධ වන අදාළ පහසුකම් පොළී අනුපාතිකය (අනුපාතික) අදාළ තැන්පතුව අලුත් කිරීමේ දී බැංකුව විසින් ස්වකීය අභිමතය පරිදි තීරණය කරනු ලැබිය යුතු බව ණය ගැනුම්කරු විසින් පිළිගෙන එකඟව සිටිනු ලැබේ.

11. ණය ගැනුම්කරු හෝ තැන්පතු හිමියා/ හිමියන් මිය යාම, බංකොලොත්භාවයට පත්වීම, ණය මුදල ගෙවා අවසන් කිරීම හෝ සිහිවිකල බවට පත්වීම මඟින් හෝ ණය ගැනුම්කරු සංස්ථාපනය වන්නා වූ තැනැත්තන්ට බලපෑමක් ඇති කරන යම් හවුල්ව්‍යාපාරයක සංයුතියේ වෙනස්වීමක් හෝ වෙනත් වෙනස්වීමක් මඟින් හෝ ණය ගැනුම්කරු සමාගමක් හෝ සංස්ථාවක් වශයෙන් සංස්ථාපනය වන අවස්ථාවක එම සමාගම හෝ සංස්ථාව සම්බන්ධ වන යම් ඒකාබද්ධ කිරීමක්, ප්‍රතිසංවිධානය කිරීමක්,

සංයුක්ත කිරීමක්, ගණන් බේරා වසා දැමීමක් හෝ ණය මුදල ගෙවා අවසන් කිරීමක් මගින් තැන්පතුව/ තැන්පතු නිර්ණය කිරීම, ඒ සඳහා බලපෑමක් ඇති කිරීම හෝ අගතියට ලක් වීම සිදු නොවිය යුතු බවට ණය ගැනුම්කරු විසින් එකඟව වගකීම් භාරගනු ලබන අතර තැන්පතු හිමියා/ හිමියන් විසින් එසේ එකඟව වගකීම් භාර ගනු ලැබීමට ණය ගැනුම්කරු විසින් කටයුතු සැලැස්විය යුතු ය.

12. ඇපය සඳහා, නිර්ලේඛන භාණ්ඩාගාර බිල්පතක්/ බිල්පත් සහ හෝ භාණ්ඩාගාර බැඳුම්කරයක්/ බැඳුම්කර සහ හෝ භාණ්ඩාගාර බිල්පත් ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම් (භාණ්ඩාගාර බිල්පත් Repos) සහ හෝ භාණ්ඩාගාර බැඳුම්කර ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම් (භාණ්ඩාගාර බැඳුම්කර Repos) ඇතුළත් වන අවස්ථාවක, ණය ගැනුම්කරු විසින්, එකී භාණ්ඩාගාර බිල්පත/ බිල්පත් සහ හෝ භාණ්ඩාගාර බැඳුම්කරය/ බැඳුම්කර සහ හෝ භාණ්ඩාගාර බිල්පත් ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම් සහ හෝ භාණ්ඩාගාර බැඳුම්කර ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම් සම්බන්ධයෙන් ලියම අයිතිය බැංකුවට ලබා දීමට එකඟ වන අතර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පවත්වාගෙන යනු ලබන මධ්‍යම තැන්පතුගාර පද්ධතියේ ආයෝජක අනන්‍යතාව යටතේ වූ CDS ගිණුම යටතේ ඔඩපන ප්‍රභේදයක් වෙත එම ඇපය මාරු කිරීම සඳහා කටයුතු සැලැස්වීමට මෙයින් බැංකුව වෙත බලය පවරනු ලැබේ.

13. නව භාණ්ඩාගාර බිල්පත්/ බැඳුම්කර නිකුත් කිරීම් ආකාරයෙන් පවත්වාගෙන යනු ලබන එම සියලු තැන්පතු ඕනෑම අවස්ථාවක සහ කලින් කලට සහ සියලු අවස්ථාවල දී ණය ගැනුම්කරුගෙන් අය විය යුතු සියලු පොළී අය කිරීම් සහ පිරිවැය සමග විකිණීමට/ හිලව් කිරීමට ණය ගැනුම්කරු විසින් බැංකුව වෙත තවදුරටත් බලය පවරනු ලැබේ.

14. නීතිය ක්‍රියාත්මක කිරීමෙන් හෝ අන්‍යාකාරයකින් වුව ද, බැංකුව හිමිකම් ලබන යම් සාමාන්‍ය ලියම අයිතියකට හෝ වෙනත් අයිතීන්ට හෝ සහනවලට අමතරව, බැංකුව විසින්, ඕනෑම අවස්ථාවක දී සහ ණය ගැනුම්කරු වෙත දැනුම් දීමකින් තොරව, බැංකුවේ ලියාපදිංචි කාර්යාලයේ හෝ එහි යම් ශාඛා කාර්යාලයක ණය ගැනුම්කරුගේ බැරට බැංකුවේ පවත්වාගෙන යනු ලබන සියලු මුදල් සංයුක්ත කිරීම, ඒකාබද්ධ කිරීම හෝ අනුයෝජනය කිරීම සිදු කරනු ලැබිය හැකි ය.

15. බැංකුව විසින් ස්වකීය ආදායම මත ගෙවිය යුතු ආයතනික බදුවලට අමතරව සහ එම බදු හැර, රජය විසින් වර්තමානයේ දී අයකරනු ලබන යම් සහ සියලු බදු හෝ, පහසුකම ප්‍රදානය කිරීමේ ප්‍රතිඵලයක් ලෙස බැංකුව විසින් ගෙවිය යුතු වන පරිදි යම් දිනයක දී

අය කරනු ලබන/ නැවත පනවනු ලබන බදු ණය ගැනුම්කරු විසින් බැංකුව වෙත ගෙවනු ලැබේ; සහ/හෝ ප්‍රතිපූරණය කරනු ලැබේ.

16. පොළිය මත වන බදු වැනි රජය වෙත සහ/හෝ යම් රජයේ අධිකාරියක් වෙත කරනු ලබන ගෙවීම් සහ නෛතික වියදම් සහ බැංකුවේ සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවලදී කලින් කල බැංකුව විසින් ණය ගැනුම්කරුගෙන් අය කරනු ලබන සියලු කොමිස් මුදල් සහ අය කිරීම් හෝ අයබදු ඇතුළු එකී පහසුකම හේතුවෙන් හෝ ඒ සම්බන්ධයෙන් බැංකුව විසින් දරනු ලබන සියලු වියදම් සහ පිරිවැය, එසේ බැංකුව විසින් දරනු ලැබීමේ දී සහ දරනු ලබන අවස්ථාවල දී ණය ගැනුම්කරු විසින් ගෙවිය යුතු ය.

17. සාමාන්‍ය බැංකු පරිචයන්ට අනුකූලව, බැංකුව විසින් වාර්ෂික පදනමක් මත පහසුකම සමාලෝචනය කරනු ලැබේ. ඒ බව නොතකා, ණය ගැනුම්කරු වෙත දන්වා, පහසුකම අලුත් කිරීමට හෝ අවලංගු කිරීමට හෝ එකී අලුත් කිරීමේ දී හෝ අන්‍යාකාරයකින් බැංකුවේ පරම අභිමතය පරිදි, පහසුකම් පොළී අනුපාතිකය (අනුපාතික) ඇතුළු එහෙත් ඊට සීමා නොවූ, පහසුකමට අදාළ නියම සහ කොන්දේසි වෙනස් කිරීම සඳහා බැංකුවට පරම අභිමතය තිබිය යුතු ය.

18. මෙහි දී ලබාදෙන ලද පහසුකම, ශ්‍රී ලංකා මහ බැංකුව සහ හෝ වෙනත් යම් අදාළ අධිකාරියක් හෝ ආයතනයක් හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලයක් විසින් කලින් කල නිකුත් කරන ලද හෝ නිකුත් කරනු ලැබිය හැකි අදාළ සියලු අනුමතයන්, විධාන සහ නියෝගවලට යටත් වන්නේ ය.

19. බැංකුව සම්බන්ධයෙන් ණය ගැනුම්කරුට පවතින සියලු වගකීම් පියවන ලෙස කියා සිටීමේ අයිතිය බැංකුව සතු වන්නේ ය.

20. ණය ගැනුම්කරු වෙත දන්වා, ස්වකීය අභිමතය පරිදි, පහසුකම වෙනස් කිරීමේ හෝ අවලංගු කිරීමේ අයිතිය බැංකුව සතුවේ.

21. බැංකුවේ පොත්, ලේඛන වාර්තාවලින් සකස් කරන ලද සහ බැංකුවේ යම් බලයලත් නිලධරයකු විසින් අත්සන් කර සත්‍ය බව සහතික කරන ලද යම් ගිණුම් ප්‍රකාශයක්, පහසුකමට අදාළව ණය ගැනුම්කරු විසින් බැංකුව වෙත නොගෙවූ සහ ගෙවිය යුතු මුදලක් සම්බන්ධයෙන් ණය ගැනුම්කරු බැඳීම් සහගත වියයුතු මෙන්ම බැඳිය යුතු අතර ඒ සම්බන්ධයෙන් වන තීරණාත්මක සාක්ෂියක් විය යුතු ය.

22. මුදල් ලබා ගැනීම් පිළිගැනීම ගිණුමේ අවසරලත් සීමාව (සීමාවන්) ඉක්මවා යාමට හේතු වන්නේ නම්, යම් මුදල් ලබා ගැනීම් පිළිගැනීම බැංකුව විසින් ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි ය. එසේ මුදල් ලබා ගැනීම ප්‍රතික්ෂේප කරනු ලැබූ බව ණය ගැනුම්කරු වෙත දැනුම් දීමට බැංකුවට කිසිදු බැඳීමක් නොමැත. බැංකුව හෝ එහි යම් නිලධරයකු විසින් ලබා දෙනු ලබන කිසිදු කාලය දීර්ඝ කිරීමක්, අත්හැර දැමීමක් හෝ අනුෂේධයක් මගින් මේ යටතේ බැංකුවේ අයිතීන්ට අගතියක් නොවිය යුතු ය. අවසරලත් සීමාව ඉක්මවායන අවස්ථාවක දී, එම ඉක්මවා යන ප්‍රමාණය මෙම නියම සහ කොන්දේසිවලට යටත් වන බව ණය ගැනුම්කරු විසින් පිළිගෙන සිටිනු ලැබේ.

23. ණය ගැනුම්කරුගේ මූල්‍ය ශක්‍යතාවට සහ හෝ පහසුකම සඳහා තබා දී ඇති ඇපයට බලපෑමක් කිරීමට ඉඩ ඇති වූ ද, ණය ගැනුම්කරු හෝ යම් තැන්පතු හිමියකු සම්බන්ධයෙන් හට ගත හැකි යම් නඩුකීමකට අදාළ වූ ද, විස්තරාත්මක තොරතුරු ණය ගැනුම්කරු විසින් බැංකුව වෙත දැනුම් දිය යුතු මෙන්ම තැන්පතු හිමියා/ හිමියන් විසින් බැංකුව වෙත එසේ දැනුම් දෙනු ලැබීමට කටයුතු සැලැස්විය යුතු ය.

24. පහසුකම් පොළී අනුපාතිකය (අනුපාතික) සහ ඒ මත වූ වෙනත් ගාස්තු ද සමග පහසුකම සම්බන්ධයෙන් ගෙවිය යුතු මුදල්, කාලාවරෝධ ආඥාපනත (68 වන වගන්තිය) නොතකා අයකර ගත හැකි විය යුතු අතර එකී මුදල් අයකර ගැනීම සඳහා ණය ගැනුම්කරුට එරෙහිව නඩු පවරන්නා වූ බැංකුව වෙත කරන බාධාවක් ලෙස ගැනුම්කරු විසින් කාලාවරෝධ ආඥාපනත (68 වන වගන්තිය) අයැද සිටීම සිදු නොකළ යුතු ය.

25. බැංකුව විසින් ණය ගැනුම්කරු වෙත ලබා දීමට අපේක්ෂා කරන පහසුකමකට අදාළ යම් හිමිකම් පෑම්, සිතාසි, නිවේදන හෝ දැන්වීම්, බැංකුව විසින් දැන සිටින ණය ගැනුම්කරුගේ නවතම ලිපිනය වෙත ලියාපදිංචි තැපෑලෙන් ලිඛිතව යථා පරිදි ලබා දී ඇති බවට සලකනු ලැබිය යුතු ය. පහසුකම් පොළී අනුපාතිකයේ (අනුපාතිකවල) වෙනස්වීම පිළිබඳ දැන්වීම් ද ප්‍රාදේශීය පුවත්පතක ඇතුළත් කරනු ලබන සහ/හෝ බැංකු පරිශ්‍රයේ ප්‍රදර්ශනය කරනු ලබන නිවේදනයක් මගින් ලබා දිය යුතු ය. ණය ගැනුම්කරු විසින් බැංකුව වෙත ලබා දෙන සියලු දැන්වීම් අංක 40, නවම් මාවත, කොළඹ 02 යන ස්ථානයේ පිහිටි බැංකුවේ ලියාපදිංචි කාර්යාලය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවනු ලැබිය යුතු ය.

26. බැංකුවේ යම් අයිතියක් හෝ ප්‍රතිකර්මයක් (පූර්ණ වශයෙන් හෝ ඉන් කොටසක් පමණක් ලෙස) ක්‍රියාත්මක කිරීමේ දී හෝ බලාත්මක කිරීමේ දී බැංකුව විසින් සිදුකරනු

ලබන යම් ප්‍රමාදයක් හෝ නොකර හැරීමක් එකී අයිතිය හෝ ප්‍රතික්‍ර්මය අත්හැර දැමීමක් ලෙස වටහා නොගත යුතු ය.

27. (අවස්ථාවෝචිත පරිදි) කිසිදු බුන්වත්භාවය හෝ මුදල් ගෙවා අවසන් කිරීම හෝ ගණන් බේරා වසා දැමීම පිළිබඳ නඩු කටයුත්තක් ණය ගැනුම්කරුට එරෙහිව ආරම්භ කර නොමැති බව හෝ ආරම්භ කිරීමට අදහස් කර නොමැති බව ද ඉල්ලුම්පත්‍රයේ සපයා ඇති සියලු තොරතුරු සත්‍ය, සම්පූර්ණ සහ නිවැරදි වන බව ද ඉල්ලුම්පත්‍රය සම්පූර්ණ කිරීමේ දී ණය ගැනුම්කරු විසින් කිසිදු වැදගත් තොරතුරක් හිතාමතා සපයා නොදී සිට නොමැති බව ද ණය ගැනුම්කරු විසින් මෙයින් කියා සිටිනු ලැබේ.

28. පහසුකම ලබා ගැනීම සඳහා ණය ගැනුම්කරු වෙනුවෙන් ණය ගැනුම්කරු විසින් බැංකුව වෙත කරන ලද ඉදිරිපත් කිරීම් සත්‍ය නොවන බව හෝ සාවද්‍ය වන බව හඳුනාගනු ලබන අවස්ථාවක හෝ බැංකුව වෙත අය විය යුතු යම් මුදල් මෙහි හෝ වෙනත් පහසුකම් ප්‍රදානය කිරීම සඳහා බැංකුව සමඟ කලින් ඇතුළත්ව තිබූ හෝ මින්මතුවට ඇතුළත් වීමට නියමිත වෙනත් යම් ගිවිසුමක/ ගිවිසුම්වල දක්වා ඇති දිනයන්හි දී නොගෙවීම ඇතුළු එහෙත් එයට සීමා නොවූ මෙහි දක්වා ඇති නියම සහ කොන්දේසි ණය ගැනුම්කරු විසින් උල්ලංඝනය කිරීමක දී, එහි ප්‍රතිඵලයක් වශයෙන්, මෙම පහසුකමේ ගෙවීම සහ බැංකුව වෙත නොගෙවූ පොළිය සහ ඒ මත වන වෙනත් ගාස්තු වහාම ඉල්ලා සිටීමට බැංකුව හිමිකම් ලැබිය යුතු ය.

29. මෙහි අන්තර්ගත යම් නියමවලට අනුකූලව ක්‍රියා නොකිරීම පැහැර හැරීමේ අවස්ථාවක් සඳහා හේතු වන්නේ ය. එවැනි අවස්ථාවල දී, බැංකුව විසින් දැනුම් දීමක් සිදුකර හෝ දැනුම් දීමකින් තොරව ඉහත සඳහන් පහසුකම අවලංගු කිරීමට සහ/හෝ ඉවත් කර ගැනීමට සහ/හෝ නතර කිරීමට කටයුතු සැලැස්වීමට සහ නොගෙවූ මුදල් පියවීමේ දී ඇපය ඇවර කිරීමට සහ/හෝ ඉහත සඳහන් කළ පහසුකම මත වර්තමානයේ දී අදාළ වන පොළී අනුපාතිකයට වඩා වැඩි පොළී අනුපාතිකයක් අදාළ කිරීමට බැංකුවට අයිතිය ඇත්තේ ය.

30. මෙම නියම සහ කොන්දේසි ශ්‍රී ලංකාවේ නීති මගින් පාලනය වන අතර ශ්‍රී ලංකාවේ අධිකරණවලට ඒ සම්බන්ධ නිසි අධිකරණ බලය පවරනු ලැබිය යුතු ය. එසේ වුව ද, වෙනත් යම් රටක දී අයිරා පහසුකම පියවීමට ඉල්ලා සිටීමට බැංකුවට අයිතිය තිබිය යුතු අතර එම කාර්ය සඳහා වෙනත් යම් රටක යම් නිසි අධිකරණයක අධිකරණ බලය අයැද සිටීමේ අයිතිය බැංකුව සතුවේ.

ණය ගැනුම්කරු/ ණය ගැනුම්කරුවන් වන මා/ අප විසින් ඉහත නියම සහ කොන්දේසි සලකා බලා මා/අප විසින් ඒවා පිළිගන්නා බව මෙයින් සහතික කරමින් මා/අප විසින් මෙහි අත්සන් කරනු ලැබේ.

12/13/2024

| | | | |
|---|---|---|---|
| 1.ඉල්ලුම්කරුගේ අත්සන | 2. ඉල්ලුම්කරුගේ අත්සන | 3. ඉල්ලුම්කරුගේ අත්සන | 4. ඉල්ලුම්තරුගේ අත්සන |

| | | | | |
|---|---|---|---|---|
| සාක්ෂි 1 . | අත්සන | | ජා.හැ./විදේශ ගමන් බලපත්‍ර අංකය | |
| සාක්ෂි 2 . | අත්සන | | ජා.හැ./විදේශ ගමන් බලපත්‍ර අංකය | |

| | | | | |
|---|---|---|---|---|
| අත්සන/ අත්සන් සත්‍ය බව සහතික කරගන්නා ලදී. ☐ | බැංකු නිලධරයාගේ නම | - | බැංකු නිලධරයාගේ අත්සන | |
| | සේවක අර්ථසාධක අරමුදල (EPF) | 0 | | |

| | | |
|---|---|---|
| | **නියම සහ කොන්දේසිවල ඇමුණුම**<br>**තැන්පතු මත වූ අයිරා** | |
| | **පහසුකම් වර්ගය** | **අයිරාව** |
| 1 | කාර්යය | 0 |
| 2 | සමුච්චිත අයිරා සීමාව | - |
| 3 | පහසුකමේ පොළී අනුපාතිකය | පහත 4 වන අයිතමය (ඉ) තීරය බලන්න |
| 4 | කාලසමාව මාසවලින් (ණය සඳහා පමණි) | ඉල්ලූ විට |
| 5 | වාරිකය (ණය සඳහා පමණි) | |
| 6 | ආපසු ගෙවීම ආරම්භ වන දිනය (ණය සඳහා පමණි) | |
| 7 | මාසික වාරිකය ගෙවිය යුතු දිනය (ණය සඳහා පමණි) | |

3 ඇපකරය

මෙම ඉල්ලුම්පත්‍රයේ 4 වන අයිතමයේ සවිස්තරාත්මකව විස්තර කර ඇති සහ පහත දී ඇති තැන්පතු සඳහා ලියම අයිතිය ලබා දෙන්න. තැන්පතු හතකට (07) වඩා වැඩියෙන් පවතින අවස්ථාවල දී 'අ' උපලේඛනය බලන්න.

| (අ) තැන්පතු හිමියාගේ සම්පූර්ණ නම | (ආ) තැන්පතු ගිණුම් අංකය | (ඇ) තැන්පතු මුදල | (ඈ) ඉල්ලා ඇති අයිරා උපසීමාව | (ඉ) පහසුකම් පොළී අනුපාතික |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |

| |
|---|
| ඇප තැන්පතු හයකට වඩා වැඩියෙන් පවතින අවස්ථාවලදී 01 වන ඇමුණුම බලන්න |
| 2 |
| 3 |
| 4 |
| 5 |

මෙහි ලබා දී ඇති තොරතුරු සත්‍ය සහ සම්පූර්ණ වන බවටත්, එක් එක් තැන්පතුව සහ රඳවා ගනු ලබන/ රඳවා ගනු ලැබීමට නියමිත ඇපයෙහි නිරවද්‍යතාවට සම්බන්ධ වන අදාළ පහසුකම් පොළී අනුපාතිකය ඇතුළුව, පහසුකම ලබා දීම යටත් වන්නා වූ ඉහත තැන්පතු මත වූ අයිරා සඳහා වන නියම සහ කොන්දේසි මා/අප විසින් කියවා, අවබෝධකරගෙන පිළිගනු ලබන බවටත්, ඒවා මා/අප විසින් පිළිගැනීම සහතික කරමින් මා/අප විසින් 2024/12/23 වන දින අත්සන් තබන ලදී.

පහසුකම් පොළී අනුපාතිකය තීරය සඳහා ('ඉ' තීරය) අදාළ අනුපාතිකය ඔබ විසින් ඇතුළත් කරන්න.

| සම්මත පහසුකම් පොළී අනුපාතිකය | | |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |

| 1. අයදුම්කරුගේ අත්සන | 2. අයදුම්කකරුගේ අත්සන | 3. අයදුම්කරුගේ අත්සන | 4. අයදුම්කරුගේ අත්සන |
|---|---|---|---|
| සාක්ෂි 1. | | ජා.හැ./විදේශ ගමන් බලපත්‍ර අංකය | |
| සාක්ෂි 2. | | ජා.හැ./විදේශ ගමන් බලපත්‍ර අංකය | |

| | | | | |
|---|---|---|---|---|
| අත්සන/ අත්සන් සත්‍ය බව සහතික කරගන්නා ලදී. ☐ | බැංකු නිලධරයාගේ නම | - | බැංකු නිලධරයාගේ අත්සන | |
| | සේවක අර්ථසාධක අරමුදල (EPF) | 0 | | |

| කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි | | | | | |
|---|---|---|---|---|---|
| සිදුවීම් පාදක කොටගත් පිරික්සුම් ලැයිස්තුව | | | | | |
| ණය ලබාදීමේ ප්‍රස්තුත වර්ගය/ අවශ්‍ය ලේඛන | ස්වකීය තැන්පතුවට එරෙහිව තනි පුද්ගල ණය ගැනීම | තුන්වන පාර්ශවයේ තැන්පතුවකට එරෙහිව තනි පුද්ගල ණය ගැනීම | ණය ගැනුම්කරු බද්ධ තැන්පතු හිමියකු වන විට බද්ධ තැන්පතුවකට එරෙහිව තනි පුද්ගල ණය ගැනීම | හවුල් නමවලින් පවතින ඔවුන්ගේ ස්වකීය තැන්පතුවලට එරෙහිව හවුල් ණය ගැනීම | හවුල් ණයගැනුම්කරුවන්ගෙන් එක් අයකුගේ නමින් පවතින තනිපුද්ගල තැන්පතුවකට එරෙහිව හවුල් ණය ගැනීම |
| යොදාගනු ලබන අයදුම් පත්‍රය | පුද්ගලික/හවුල් | | | | |
| නිසි පරිදි සම්පූර්ණකර අත්සන් කරන ලද තැන්පතු මත වූ අයදුම්පත්‍රය සහ නිසි පරිදි සම්පූර්ණ කර අත්සන් කර සත්‍ය බව සහතික කර සහ සාක්ෂි දරන ලද ගිවිසුම | √ | √ | √ | √ | √ |
| තුන්වන පාර්ශ්වයේ තැන්පතුවක් සඳහා වන නිසි පරිදි අත්සන් කරන ලද හිලව් කිරීමේ ලිපිය | අදාළ නොවේ | √ | √ | අදාළ නොවේ | √ |
| තුන්වන පාර්ශ්වයේ තැන්පතු හිමියකු විසින් තබන පුද්ගලික ඇපකරය | අදාළ නොවේ | √* | √ | අදාළ නොවේ | අදාළ නොවේ |
| තුන්වන පාර්ශ්වයේ තැන්පතු හිමියන් එක් අයකුට වඩා සිටින අවස්ථාවක දී තුන්වන පාර්ශ්වයේ තැන්පතු හිමියකු විසින් තබන හවුල් සහ වෙන්වෙන් වශයෙන් වූ ඇපකරය | අදාළ නොවේ | √* | අදාළ නොවේ | අදාළ නොවේ | අදාළ නොවේ |
| මුළු මුද්‍රිත ලේඛන ගණන | 1 | 3 | 3 | 1 | 2 |

*අදාළ වන පරිදි

| නිර්දේශය කරනු ලැබුවේ | | නිර්දේශ කරනු ලැබුවේ/ අනුමත කරනු ලැබුවේ | | අනුමත කරනු ලැබුවේ |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |
| | | | | |
| නම සහ තනතුර | | නම සහ තනතුර | | නම සහ තනතුර |